සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2015 ජූලි

## (AA14) ව්‍යාපාර නීතිය හා ආචාරධර්ම

(Business Law and Ethics)

2015-07-26
පස්වරු
[1.00 – 3.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) *කාලය: පැය 02.*
  - (2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයීම අනිවාර්ය වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  - (4) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (5) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න දහ අට (18) කි

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.11 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීම සඳහා අධිකරණ බලය ඇත්තේ පහත සඳහන් කුමන අධිකරණයකට ද?

(1) අභියාචනාධිකරණයටය.
(2) ශ්‍රේෂ්ඨාධිකරණයටය.
(3) වාණිජ මහාධිකරණයටය.
(4) ප්‍රාදේශීය මහාධිකරණයටය.
(ලකුණු 02)

1.2 පහත ඒවා අතුරෙන්, **වැරදි** ප්‍රකාශය වන්නේ:

(1) ආචාරධර්ම කඩ කිරීම කිසිවෙකුට දඬුවම් පමුණුවනු නොලබයි.
(2) අපරාධ යනු, රජයට එරෙහිව සිදුකරන වැරදි වේ.
(3) නීතිය සහ සදාචාර ප්‍රමිති යනු සැමවිටම එකම දෙයකි.
(4) ශ්‍රේෂ්ඨාධිකරණය යනු ඉහළම සහ අවසාන අභියාචනා අධිකරණයයි.
(ලකුණු 02)

1.3 **කමල්** මහා විදිය දිගේ ඇවිදගෙන යද්දී රු.200,000/- ක මිල සඳහන් ලේබලයක් සහිතව තබා ඇති හයිබ්‍රිඩ් කාර් රථයක් දකී. **කමල්** රු.200,000/- ක මුදල් රැගෙන එම ස්ථානයට ආපසු පැමිණ ලේබලයේ සඳහන් කර තිබෙන මුදලට එම කාර් රථය මිලදී ගැනීමට ඔහු කැමති බව පවසයි. එය වැරදීමක් බවත්, කාර් රථයේ මිල රු.2,000,000/- ක් සේ සඳහන් විය යුතු බවත් විකුණුම්කරු විසින් ඔහුට පවසයි. ගිවිසුම් නීතිය අනුව ලේබලයේ දක්වා ඇති මිල ඔබ විස්තර කරන්නේ කෙසේ ද?

(1) අර්පණයක් ලෙසය. (2) ටෙන්ඩරයක් ලෙසය.

(3) අර්පණය කිරීම සඳහා ඇරයුමක් ලෙසය. (4) ප්‍රතිග්‍රහණයක් ලෙසය.

(ලකුණු 03)

1.4 සමාගමක, සාංගමික ව්‍යවස්ථාවලිය වෙනස් කිරීම සඳහා පහත සඳහන් යෝජනා සම්මත (resolution) වර්ග අතුරෙන්, කුමන යෝජනා සම්මතයක් අවශ්‍ය වන්නේ ද?

(1) විශේෂ යෝජනා සම්මතය.

(2) සාමාන්‍ය යෝජනා සම්මතය.

(3) විශේෂ දැන්වීමක් සහිත සාමාන්‍ය යෝජනා සම්මතය.

(4) අධ්‍යක්ෂවරුන්ගේ යෝජනා සම්මතය. (ලකුණු 02)

1.5 අවශ්‍යතාවය මත නියෝජ්‍යත්වය පැන නගින්නේ:

(1) හදිසි අවස්ථාවක් (emergency situation) ඇති වූ විටය.

(2) ප්‍රධානියා විසින් ප්‍රකාශිතව (expressly) නියෝජිතයා පත් කර ඇති විටය.

(3) ප්‍රධානියා සහ නියෝජිතයා ඔවුනොවුන් නොදැන සිටින විටය.

(4) ප්‍රධානියා විසින් පසුව ගනුදෙනුව සඳහා අනුමැතිය (ratifies) දෙනු ලබන විටදිය. (ලකුණු 02)

1.6 1986 භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ බලපැමට යටත් **නොවන්නේ** පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?

(1) එළදෙන. (2) විදේශ මුදල්.

(3) ඔක්සිජන් සිලින්ඩරය. (4) ඉහත සඳහන් සියල්ලම වේ. (ලකුණු 02)

1.7

**(a)** සියලුම එකඟතාවයන් නෛතික බැඳීමට යටත් ගිවිසුම් වේ.

**(b)** වාණිජමය ගිවිසුම් සලකා බැලීමේදී, අදාල පාර්ශවයන් "නෛතික වශයෙන් බැඳීමට ලක්වන එකඟතාවයන් නිර්මාණය කර ගැනීමේ අදහසින් යුක්ත යැයි" අනුමාන කෙරේ.

**(c)** ගිවිසුමක පාර්ශවකරුවන්ට එම ගිවිසුම් වලට අදාල නෛතික කරුණු නිසි බලය ඇති උසාවියකදී විභාගයට ගනු ලැබීම බැහැර කළ නොහැකිය.

ඉහත ඒවා අතුරෙන් නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ:

(1) **(b)** පමණි. (2) **(b)** සහ **(c)** පමණි.

(3) **(a)** සහ **(b)** පමණි. (4) ඉහත සඳහන් කිසිවක් නොවේ. (ලකුණු 03)

1.8

(a) පාලනය පිළිබඳ පරීක්ෂණය (Control test).

(b) ඒකාබද්ධතා පරීක්ෂණය (Integral test).

යම්කිසි පුද්ගලයෙකු සේවකයෙකු ද නැතහොත් ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකු ද යන වග නිගමනය කිරීම සඳහා අධිකරණයට උපකාරී වන්නේ ඉහත සඳහන් ඒවා අතුරෙන් කුමන පරීක්ෂණය ද?

(1) (a) පමණි. (2) (b) පමණි.

(3) (a) සහ (b) යන දෙකම වේ. (4) ඉහත සඳහන් කිසිවක් නොවේ. (ලකුණු 02)

1.9 පහත සඳහන් ඒවා අතුරෙන් **වැරදි** ප්‍රකාශයක් වන්නේ:

(1) චෙක්පතක් යනු විනිමය බිලක් නොවේ.

(2) චෙක්පතක අණ ලද්දා සෑම විටම බැංකුවකි.

(3) රේඛණය කල චෙක්පතක් කවුන්ටරයෙන් මුදල් කර ගත හැකිය.

(4) ගනුදෙනු කල නොහැකි චෙක්පතක් තවදුරටත් පැවරිය හැකිය. (ලකුණු 02)

1.10

(a) වෘත්තිය ගණකාධිකාරිවරයෙකු විසින් ආචාරධර්ම පිළිබඳ අර්බුදයක් විසඳීමේදී අදාල කරුණු, සම්බන්ධිත ආචාර ධර්ම ගැටළු සහ මූලික මූලධර්ම සළකා බැලිය යුතුය.

(b) වෘත්තිය ගණකාධිකාරිවරයෙකු විසින් ගැටළුවේ හරය (substance) සහ ඒ සම්බන්ධයෙන් කරන ලද සාකච්ඡා පිළිබඳ විස්තර වාර්තා කර තබා ගැනීම හැම විටම ප්‍රඥාන්විත වනු ඇත.

(c) ගැටළුවක් ඇතිවූ විට වෘත්තිය ගණකාධිකාරිවරයෙකු විසින් වහාම දිස්ත්‍රික් උසාවියේ නඩුවක් පැවරිය යුතුය.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමන ප්‍රකාශ ද?

(1) (a) සහ (b) පමණි. (2) (a) සහ (c) පමණි.

(3) (b) සහ (c) පමණි. (4) ඉහත සඳහන් සියල්ලම වේ. (ලකුණු 03)

1.11 පහත සඳහන් ඒවා අතුරෙන් ශ්‍රී ලංකාවේ පොදු නීතිය වශයෙන් සළකනු ලබන්නේ කුමක් ද?

(1) ඉංග්‍රීසි නීතිය. (2) රෝම ලන්දේසි නීතිය.

(3) සිවිල් නීතිය. (4) තේසවලාමෙයි නීතිය. (ලකුණු 02)

*අංක **1.12** සිට **1.14** දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයන් **සත්‍ය** හෝ **අසත්‍ය** බව දක්වන්න. තෝරාගත් උත්තරය (**සත්‍ය හෝ අසත්‍ය** යන්න) ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.12 **අමිලා** පහත රට දෙමාපියන් ට දාව ගාල්ලේදී උපන්නාය. ඇය නිවාසයක් මිලදී ගෙන මහනුවර ස්ථිර ලෙස පදිංචි වී සිටී. ඇය මහනුවර පලාතේ පදිංචි බැවින් ඇයට අදාල වන්නේ උඩරට නීතිය යැයි ඇය තර්ක කරයි. (ලකුණු 02)

1.13 සීමාසහිත පුද්ගලික සමාගමක අවම කොටස්හිමියන්ගේ සංඛ්‍යාව එකකි. (ලකුණු 02)

1.14 "ගනුදෙනු කළ නොහැකි ය" යනුවෙන් රේඛණය කළ චෙක්පතක් ආදායකයා විසින් වෙනත් පාර්ශවයකට දීම කළ නොහැකිය. (ලකුණු 02)

*අංක **1.15** සිට **1.18** දක්වා දී ඇති ප්‍රශ්න වලට කෙටි උත්තර, ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.15 ගනුදෙනු කළ හැකි සාධන පත්‍රයක (negotiable instrument) ලක්ෂණ දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 02)

1.16 වෘත්තීය ආචාර ධර්ම (professional ethics) වල මූලික මූලධර්ම දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 02)

1.17 මාසිකව වැටුප් ගෙවීම් ලබන සේවකයෙකුගේ පාරිතෝෂිකය (gratuity) ගණනය කිරීම සඳහා භාවිත කරන සූත්‍රය කුමක් ද? (ලකුණු 02)

1.18 කාර්මික ආරවුලක් විසඳිය හැකි ක්‍රම තුනක්(03) ලැයිස්තුගත කරන්න. (ලකුණු 03)

*A කොටසෙහි අවසානය*

# B කොටස

අනිවාර්යය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 32)

## 02 වන ප්‍රශ්නය

"සාමාන්‍ය නියමයක් වශයෙන්, ප්‍රධානියා විසින් කලින් දෙනු ලබන ප්‍රකාශිත බලය නොමැතිව නියෝජිතයා ක්‍රියා කරන විට, ප්‍රධානියා හා නියෝජිතයා අතර සම්බන්ධතාවක් ඇති නොවනු ඇත. කෙසේවෙතත්, ප්‍රධානියා පසුව එය අනුමත කරන්නේ (ratifies) නම්, පසුව අනුමත කිරීම මත (අපරානුමතියෙන්) නියෝජ්‍යත්වය හට ගනී."

පසුව අනුමත කිරීම මත නියෝජ්‍යත්වය ඇති වීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා හතරක්(04) **පැහැදිලි කරන්න**.

(ලකුණු 08)

## 03 වන ප්‍රශ්නය

(a) "වගකීම් සීමාසහිත සමාගම අද ඉතාමත් ජනප්‍රිය ව්‍යාපාරික ආකෘතියක් බවට පත් වී තිබේ."

වගකීම් සීමාසහිත සමාගමක වාසි තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) "සාංගමික ව්‍යවස්ථාවලිය සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු (ගොනු කළ යුතු) වැදගත් ලේඛණයකි."

සමාගමක සාංගමික ව්‍යවස්ථාවලියේ ප්‍රධාන අන්තර්ගතයන් දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 08)

## 04 වන ප්‍රශ්නය

"යථා කාලයේ දරන්නාට (holder in due course) බිල් පත්‍රයක් සම්බන්ධයෙන් වඩා හොඳ හිමිකමක් (good title) ලැබෙනු ඇත."

යථා කාලයේ දරන්නකු වීමට සපුරාලිය යුතු අවශ්‍යතා හතරක්(04) **පැහැදිලි කරන්න**. (ලකුණු 08)

## 05 වන ප්‍රශ්නය

පහත සඳහන් එක් එක් අවස්ථාවේදී **X** හට සේවක අර්ථසාධක අරමුදලෙන් (Employees' Provident Fund - EPF), දායක මුදල් ආපසු ලබා ගැනීමට හිමිකමක් තිබේදැයි **විමසන්න**:

(a) **X** වයස අවුරුදු 50 ට එළඹීමේදී. (ලකුණු 02)

(b) **X** කොන්ත්‍රාත් පදනමක් මත ඔස්ට්‍රේලියාවේ සේවය කිරීමට ශ්‍රී ලංකාවෙන් පිටත්ව යෑමේදී. (ලකුණු 02)

(c) **X** ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් බාර ගැනීමේදී. (ලකුණු 02)

(d) **X** විවාහවීම හේතුවෙන් සේවයෙන් අස්වීමේදී. (ලකුණු 02)

(මුළු ලකුණු 08)

*B කොටසෙහි අවසානය*

## <u>C කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 28)

### 06 වන ප්‍රශ්නය

(a) වලංගු ගිවිසුමක අවශ්‍යතා හතරක්(04) **පැහැදිලි කරන්න**. (ලකුණු 08)

(b) **චාමර** වයස අවුරුදු 17 ක පිරිමි ළමයෙකි. ඔහුගේ එකම ඥාතියා සුළු ආදායමක් ඇති ඔහුගේ මව පමණි. ගුරු පුහුණු විද්‍යාලයක පුහුණුව ලබා පුහුණු කාලය නිමවීමෙන් පසු අවුරුදු 2 ක කාලයක් ආණ්ඩුවේ සේවය කිරීමට ඔහු ගිවිසුමකට එළඹුණේය. කෙසේවෙතත්, පුහුණු කාලය නිමවීමත් සමග **චාමරට** සිංගප්පූරුවේ හොඳ රැකියා අවස්ථාවක් ලැබුණි. එම රැකියාව සඳහා **චාමරට** දැන් රට හැර යාමට අවශ්‍ය වී තිබේ.

මෙහි වලංගු ගිවිසුමක් තිබේදැයි **විමසන්න**. (ලකුණු 06)
(මුළු ලකුණු 14)

### 07 වන ප්‍රශ්නය

(a) සාමාන්‍ය නියමයක් වශයෙන්, විකුණුම්කරුට තිබූ හිමිකමට වඩා හොඳ හිමිකමක් ගැනුම්කරු අත්පත් කර නොගනී. (*nemo dat quod non habet*).

**මෙම** නියමයට ඇති ව්‍යාතිරේක (exemptions) හතරක්(04) **පැහැදිලි කරන්න**. (ලකුණු 08)

(b) නගරයේ ප්‍රසිද්ධ නිමි ඇඳුම් වෙළෙඳසැලකින් **ශෙහාන්** කමිසයක් මිලදී ගත්තේය. එම කමිසයේ අඩංගුව තිබූ රසායනික ද්‍රව්‍යයක් හේතුවෙන් ඔහුගේ සමේ ආසාදනයක් (චර්ම ප්‍රදාහය) (dermatitis) ඇති විය.

මෙම ඇඳුම් වෙළෙඳසැලට එරෙහිව පැමිණිලි කර වන්දි ඉල්ලා සිටීමට **ශෙහාන්ට** හිමිකමක් තිබේදැයි **විමසන්න**.

(ලකුණු 06)

(මුළු ලකුණු 14)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |